## ලංකා කෝල් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් - 2017

------------------------------------------------------------

ලංකා කෝල් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්හි (“සමාගම”) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන සමාගමේ කාර්යසාධනය පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“මණ්ඩලයේ”) වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-----------------------------------------------------

(අ) එකතු කළ අගය මත බදු (VAT), ආර්ථික සේවා ගාස්තු (ESC) හා රැඳවුම් බදු එකතුව වන රු.27,478,787 ක් හා ගෙවිය යුතු බදු වන රු.11,703,151 ක් මූල්‍ය ප්‍රකාශනවල 15 හා 20 යන සටහන්වල පිළිවෙලින් ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් ලෙස දක්වා තිබුණි. මේ අතර, රු.3,371,326 ක් හා රු.12,758,801 ක් වූ අසාමාන්‍ය හර ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ණය හිමියන් යටතේ පිළිවෙලින් ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) හා එකතු කළ අගය මත බද්ද

(VAT) ලෙස දක්වා තිබුණි. බදු ගණනය කිරීම් හා බදු ප්‍රතිලාභ තොරතුරු වැනි ප්‍රමාණවත් හා විධිමත් විගණන සාක්ෂි නොපැවතීම හේතුවෙන් විගණනයේදී මෙම ශේෂයන් ප්‍රමාණවත් පරිදි සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. තවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ කතිකා කර ගැනීම මගින් මෙම ශේෂයන් නිරවුල් කර ගැනීමට සමාගම විසින් කාර්යක්ෂම ක්‍රියාමාර්ග, මෙම වාර්තාවේ දිනය දක්වාම ගෙන නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල සටහන 22 ට අනුව, වාර්තා කරන කාල සීමාවේ අවසානයට ආදායම් බදු බැරකම් රු.65,474,540 ක් විය. කෙසේ වෙතත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වාර්තාවල එය රු.4,046,601 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ආදායම් බදු බැරකම රු.61,427,939 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ලංකා විදුලිබල මණ්ඩලයට සපයා ඇති ගල් අඟුරුවල අගය පිළිබඳව ආර්ථික සේවා ගාස්තු සඳහා සමාගම වගකිව යුතු වේ. කෙසේ වෙතත්, මේ සඳහා, මූල්‍ය ප්‍රකාශනවල රු.159,790,628 ක ප්‍රතිපාදනයක් කිරීමට සමාගම විසින් අසමත් වී තිබුණි.

(ඈ) 2016 අංක 20 දරන එකතු කළ අගය මත බද්ද (සංශෝධිත) පනතට අනුව, 2016 නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි, "ගල් අඟුරු ආනයනය හා සැපයීම" මත ලබාදී තිබෙන එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම ඉවත් කර තිබුණි. ඒ අනුව, ගල් අඟුරු ආනයනය හා සැපයීම මත එකතු කළ අගය මත බද්ද ගෙවීම සඳහා සමාගම වගකිව යුතු විය. කෙසේ වෙතත්, පිළිවෙලින් රු.5,071,823,613 ක් හා රු.4,790,535,258 ක් වන යෙදවුම් එකතු කළ අගය මත බද්ද සමාගම විසින් ගිණුම්ගත කර නොතිබුණි. තවද, රු.281,288,355 ක් වන ප්‍රතික්ෂේපිත එකතු කළ අගය මත බද්ද සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සළකා තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, අලෙවි පිරිවැය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. එමෙන්ම, ප්‍රතික්ෂේපිත එකතු කළ අගය මත බදු අගය සමාගම විසින් ලංකා විදුලිබල මණ්ඩලයට ඉන්වොයිසිගත කර නොතිබුණි. ඒ අනුව, සමාගම විසින් සමාගමේ ආදායම රු.281,288,355 කින් අඩුවෙන් දක්වා තිබූ අතර රු.42,193,253 ක්වූ බදු බැරකම් වාර්තා කර නොතිබුණි.

(ඉ) විගණනයට ඉදිරිපත් කරන ලද විස්තරාත්මක උපලේඛනයට අනුව, ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු මුදලක් ලෙස රු.478,179,795 ක් මූල්‍ය ප්‍රකාශනවල සටහන 19 හි ඇතුළත් වී තිබුණි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවල සටහන 10 ට අනුව, ගල් අඟුරු හා වෙනත් ලැබිය යුතු ද්‍රව්‍ය බෙදා හැරීමට අදාළව ලංකා නැව් සමාගම වෙතින් අනුරූපී අගය රු.539,192,079 ක් විය. ඒ අනුව, මෙම අගයන් අතර රු.61,012,284 ක නොසැසඳුනු වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ගනුදෙනුවෙහි දින සිට වසර පහක් ගත වී ඇති නමුත්, මෙම ලැබිය යුතු ශේෂය ලංකා නැව් සමාගම වෙතින් අයකර ගැනීමට සමාගම විසින් අසමත් වී තිබුණි. ඉහත දක්වන ලද ශේෂය අයකර ගැනීම විගණනයේදී තහවුරු කරගත නොහැකි වූ අතර ඉහත දක්වන ලද ශේෂය සඳහා වන ප්‍රතිපාදනය අස්ථිත්වය විසින් පිළිගැනීමට ලක්කර නොතිබූ බැවින්, මූල්‍ය ප්‍රකාශන සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කෙරෙහි එය බලපා තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම**

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නියමය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) විගණන මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත සඳහන් පරිදි වේ.

(ආ) මාගේ මතය වනුයේ,

- තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මා විසින් විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් ලබා ගන්නා ලද බව සහ මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇත.

- සමාගමේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 සහ 153 වගන්තිවල අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

**2.2 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම හා කළමනාකරණ අඩුපාඩු**

---

විගණනයේදී පහත අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අනුමැතිය ලත් වෛද්‍ය සත්කාර යෝජනා ක්‍රමයකින් තොරව සමාගම විසින් රු.1,144,193 ක් කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපූරණය කර තිබුණි. |
| (ආ) 2016 දෙසැම්බර් 16 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | මුළුමනින්ම රජය සතු සමාගම්වල සේවකයන්ට ප්‍රසාද දීමනාව ගෙවීමට පෙර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය. කෙසේ වෙතත්, ලංකා කෝල් කම්පැණි (LCC) සමාගම විසින් ප්‍රසාද දීමනා ලෙස රු.1,331,006 ක් අදාළ අනුමැතිය ලබාගැනීමෙන් තොරව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා ගෙවා තිබුණි. |
| (ඇ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාගම විසින් රු.1,199,510 ක් මුදල් කළ හැකි නිවාඩු සඳහා, විධිමත් අනුමැතියක් ලබාගැනීමෙන් තොරව ගෙවා තිබුණි. |
| (ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2006 (එන්පීඒ චක්‍රලේඛ (අංක 08)) | |
| (i) 8.9.3 මාර්ගෝපදේශය | රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් |

අත්සන් කිරීම වෙනුවට, සමාගමේ සභාපතිවරයා විසින් රු.මිලියන 500 ඉක්මවූ ගල් අඟුරු ප්‍රසම්පාදන ගිවිසුම්වලට අත්සන් තබා තිබුණි.

(ii) 8.8 මාර්ගෝපදේශය

ඉදිරියේදී වඩාත් අනුකූලතාවයක් දක්වන හා තරඟකාරී ලංසු ඉදිරිපත් කිරීම සඳහා, අසාර්ථක ලංසුකරුවන්, ලංසුකරුවන් දැනුවත් කිරීමේ පූර්ණ අරමුණක් සමඟ කෙටියෙන්, ඔවුන්ගේ අඩුපාඩු පිළිබඳව දැනුවත් කළ යුතු වුවද, එය එසේ සිදුකර නොතිබුණි.

(iii) 2006 අංක 10 දරන දේශීය ආදයම් පනත

(i) රු.592,244, ක් වූ ගෙවිය යුතු බදු මුදල සඳහා, පොළී ආදායම මත, සමාලෝචිත වර්ෂය සඳහා සමාගම විසින් ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි.

(ii) 2016 හා 2017 වර්ෂ සඳහා ආදායම් බදු සඳහා ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි.

(iii) සමාගම විසින් 2017/2018 වර්ෂය සඳහා බදු ආදායම්වල ස්වයං ඇගයීම් සිදුකර නොතිබුණි.

(iv) 2015/2016 හා 2016/2017 ඇගයීම් වර්ෂවල ආදායම් බදු ප්‍රතිලාභ නියමිත දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යවා නොතිබුණි.

(ඊ) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත

(i) රු.159,790,628 ක් වන 2017/2018 ඇගයීම් වර්ෂය සඳහා වන ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු සමාගම විසින් ගෙවා නොතිබූ අතර ගිණුම්වල ඒ සඳහා ප්‍රතිපාදනයක්ද සිදුකර නොතිබුණි.

(ii) 2017/2018 ඇගයීම් වර්ෂය සඳහා ආර්ථික සේවා ගාස්තු ප්‍රතිලාභ 2018 අගෝස්තු 06 වන දිනටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යවා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වල ප්‍රතිඵලය, පෙර වර්ෂයෙන් පසුව සමාගම විසින් දරන ලද පොදු කාර්ය පිරිවැය ප්‍රතිපූරණය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ තිබීම හේතුවෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව බදු පෙර ශුද්ධ ලාභයක් හෝ බදු පෙර ශුද්ධ අලාභයක් නොවීය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් දක්වා ඇති පරිදි සමාලෝචිත වර්ෂය සඳහා සමාගම විසින් සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

වාර්ෂික ලාභයක් හෝ අලාභයක් හෝ සැළකීමට නොහැකි බැවින් සමාගමේ කාර්යසාධනය මැනිය නොහැකි වූ අතර සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය අනුව ව්‍යාපාර නොයෙකුත් ක්ෂේත්‍ර කරා විහිදිය හැකිය. කෙසේ වෙතත්, ලංකා කෝල් කම්පැණි (LCC) සමාගම සමාලෝචිත වර්ෂයේදි තම ව්‍යාපාර පුළුල් කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම හා ලිබර්ටි කොමෝඩිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් (LCL) සමාගම අතර එළඹ ඇති ගල් අඟුරු සැපයීමේ ගිවිසුමෙහි පවතින දෝෂ සහගත මිල ගණන් ගැළපීමේ සූත්‍ර හේතුවෙන් සමාගම විසින් 2015 හා 2016 වර්ෂ සඳහා රු.233,193,318 ක වැඩිපුර ගෙවීමක් සිදුකර තිබුණි. තවද, බේරුම්කරණ හා මහාධිකරණ නඩු ඉදිරියට ගෙන යාම සිදුකරනු ලැබ ඇති අතර සමාලෝචිත වර්ෂය තුලදී දැරිය යුතු වූ නීතිමය ගාස්තුව රු.3,435,896 ක් වූ අතර එයද ලංකා විදුලිබල මණ්ඩලයෙන් ප්‍රතිපූරණය කර තිබුණි.

(ආ) සමාගම හා ලංකා විදුලිබල මණ්ඩලය අතර එළඹ ඇති ගිවිසුම අනුව, ගල් අඟුරු ප්‍රසම්පාදනයට වියදම් පමණක් ප්‍රතිපූර්ණය කළ හැකිය. කෙසේ වෙතත්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව හා අයවැය ප්‍රතිපාදනයට ඇතුළත් කිරීමෙන් තොරව සමාගම විසින් 2017 වර්ෂය සඳහා රු.325,000 ක පරිත්‍යාග හා අනුග්‍රාහකත්වයන් ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.

## 4.3 ප්‍රසම්පාදන කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා කෝල් කම්පැණි (LCC) සමාගම අතර, 2017 අප්‍රේල් 30 දින සිට 2017 සැප්තැම්බර් 01 දින දක්වා කාල සීමාව සඳහා ගල් අඟුරු මිලදී ගැනීමේ ගිවිසුමක් නොවීය.

(ආ) ගල් අඟුරු සැපයීම ආරම්භ කිරීමෙන් පසු සමාගම විසින් වරාය ගල් අඟුරු විශ්ලේෂණ වාර්තා එස්ජීඑස් ලංකා (ප්‍රයිවට්) ලිමිඩට් සමාගම වෙතින් ලබාගෙන තිබුණි. කෙසේ වෙතත්, බොහෝ අවස්ථාවලදී එස්ජීඑස් සමූහයේ පරිපාලිත සමාගමකින්, ගල් අඟුරු සැපයුම්කරුවන් විසින් වරාය තත්ත්ව විශ්ලේෂණ වාර්තා ලබාගෙන තිබුණි. එස්ජීඑස් සමූහයෙන් තත්ත්ව විශ්ලේෂණ වාර්තා සැපයුම්කරුවන් විසින් ලබාගැනිම වළක්වා ගැනීමට කොන්දේසි ගිවිසුමෙහි ඇතුළත් කර නොතිබුණි. එස්ජීඑස් සමූහයේ තත්ත්ව විශ්ලේෂක වෙතින් වාර්තා දෙකම ලබා ගැනීම එස්ජීඑස් සමූහයේ තත්ත්ව විශ්ලේෂකගේ ස්වාධීනත්වයටද, වාර්තාවල නිරවද්‍යතාවය කෙරෙහිද බලපානු ඇත.

(ඇ) 2017/2018 කාලසීමාව සඳහා වන සම්පූර්ණ ගල් අඟුරු අවශ්‍යතාවය දකුණු අප්‍රිකාවෙන් ලබා දී තිබූ බැවින්, ඊට යෝග්‍ය ගල් අඟුරු මිල දර්ශකය API 4 විය. කෙසේ වෙතත්, Spot- II සඳහා ලබාදී තිබූ මිල ඊට යෝග්‍ය API 4 දර්ශකයට වඩා ඉහළ බව නිරීක්ෂණය විය. ඒ අනුව, දැරිය යුතු සම්පූර්ණ අමතර පිරිවැය රු.198,092,544 ක් විය. (ඇ.ඩො.1,269,824)

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයාගේ විෂය පථය, ස්වභාවය හා වගකීම සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ විෂය පථය හා වගකීමට වඩා පුළුල්ව පැවතියද, ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයාගේ වැටුපට සමාන වන පරිදි කළමනාකාර අධ්‍යක්ෂවරයාට මසකට රු.289,380 ක් ගෙවා තිබුණි. තවද, ලංකා විදුලිබල මණ්ඩලයේ වැටුප් තලවලට අනුව සමාගමේ සේවකයන්ට වැටුප් ගෙවා තිබුණි.

## 4.5 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධිමත් පරිදි අනුමත කරන ලද බඳවා ගැනීම් පරිපාටියකින් (SOR) තොරව හා අයදුම්පත් කැඳවීම හා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම තුළින් සිදුකරන විධිමත් තෝරා ගැනීමේ ක්‍රියාවලියකින් තොරව නිලධාරීන් පස් දෙනෙකු සමාලෝචිත වර්ෂයේදී බඳවාගෙන තිබුණි.

(ආ) බඳවා ගැනීමේදී හා රාජකාරී හා වගකීම් වෙනස් කරනු ලබන අවස්ථා වලදී සමහර සේවකයින්ගේ රැකියා විස්තර ලබාදී නොතිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 ප්‍රසම්පාදන සැලැස්ම

සමාගම විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. කෙසේ වෙතත්, ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික ගල් අඟුරු අවශ්‍යතාවය මත පදනම් වෙමින් යාවත්කාලීනව උපලේඛන සකස් කර තිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

**5.3 විගණන කමිටුව**

2017 වර්ෂයේදී එක් විගණන කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

**5.4 සමාජ වගකීම්**

ලක් විජය බලාගාරයේ දැවි අළු බලාගාර පරිශ්‍රය තුළ බැහැර කිරීම සිදු කරනු ලබන අතර එය පරිසරයට තර්ජනයක් වී ඇත. ඒ අනුව, සමාගම විසින්, පරිසර හිතකාමී ආකාරයෙන් අළු බැහැර කිරීම කළමනාකරණය සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා කාර්මික තාක්ෂණ ආයතනය (Industrial Technology Institute) විසින් සිදුකරන ලද පරීක්ෂණවලට අනුව එම නිෂ්පාදන පිළිගත හැකිව තිබුණි. කෙසේ වෙතත්, ආයෝජනය කරන ලද අරමුදල් අපතේ යාම හා අදාළ පාරිසරික ගැටළුව තවදුරටත් පැවතීමට ඉඩ හැරීම වැනි බාහිර කරුණු හේතුවෙන් ව්‍යාපෘතිය වසර 02 කට පෙර අත්හිටුවා තිබුණි.

**5.5 අයවැය ලේඛනමය පාලනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විෂයයන් 25 ක සියයට 20 සිට සියයට 180 දක්වා වූ වැදගත් විචලනයන්, අයවැයගත අගයන් හා තථ්‍ය අගයන් අතර නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව, වාර්ෂික අයවැය ලේඛනයට, අයවැයගත ආදායම් හා වියදම් ප්‍රකාශනය, වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක්, වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක් හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ අයවැයගත ප්‍රාග්ධන වියදම් ප්‍රකාශනයක් ඇතුළත් විය යුතුය. කෙසේ වෙතත්, සමාගම එම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | රිසිට්පත් ගිණුම්ගත කිරීමේ, ප්‍රධාන ලෙජරය හා ජර්නල් සටහන්වල පාලනයේ අඩුපාඩු. |
| (ආ) | පොත්පත් හා වාර්තා පවත්වා ගැනීම | (i) මුදල් හෝ චෙක්පත් ලේඛනය පවත්වා නොයාම.<br>(ii) අනුක්‍රමික අනුපිළිවෙලකට අනුව රිසිට්පත් නිකුත් නොකිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) | ගෙවීම් | ගෙවීම් සිදු කිරීමට පෙර විධිමත් පරිදි වවුචර්පත් සහතික නොකිරීම. |
| (ඈ) | ණයගැතියා/ ණයහිමියා | ණයගැතියන් හා ණය හිමියන් වෙත විධිමත් පාලනයක් නොවීම. |
| (ඉ) | රාජකාරී බෙදා වෙන් කිරීම | රාජකාරී බෙදා වෙන් කිරීමක් සිදුකර නොතිබීම. |
| (ඊ) | මුදල් කළමනාකරණය | ක්‍රියාවිරහිත ගිණුමක රු.1,234,568 ක නිෂ්ක්‍රීය මුදල් ශේෂයක් පැවතීම. |